// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2087/29 - 2018 සැප්තැම්බර් මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2018.09.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාත් සභාවේ යෝජිත 2018 අංක 04 දරන ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය

මධ්‍යම පළාතේ සභාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් ප්‍රඥප්තියේ කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පළ කරමි.

මෙම දැන්වීම පළවීමෙන් දින 10 ක් ඉක්මවා ගිය පසු, මෙම කෙටුම්පත අනුමැතිය සඳහා මධ්‍යම පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම්, මෙම දැන්වීමෙන් දින 10 ක් තුළදී එකී කරුණු ලිඛිතව පහත ලිපිනයට මා වෙත දැනුම් දිය යුතු ය.

බන්දුල එස්. බී. යාලෙගම,
මධ්‍යම පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය,
සමාජ සුභ සාධන පරිවාස හා ළමා රක්ෂක
සේවා කටයුතු පිළිබඳ අමාත්‍ය.

තැ.පෙ. 121,
සංඝරාජ මාවත,
මහනුවර.

### මධ්‍යම පළාතේ 2018 අංක 04 දරන ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය

අනාථ, අත්හල, අසරණ සහ අධිකරණ නියෝග මත භාරය සහ ආරක්ෂාව අවශ්‍ය ළමයි සඳහා වාසස්ථාන පහසුකම් සහ ආරක්ෂාව සැපයීම සහ ඒ හා සමාන වූ කාර්යයන් සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම,අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම සඳහා ද, ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ද, ඒ පිළිබඳව කොමසාරිස්වරයාගේ බලතල නිශ්චය කිරීම සඳහා ද, ඒ හා සම්බන්ධ වූ හා ඊට ආනුශාංගික වූ කාරණා සඳහා විධිවිධාන සැලසීම පිණිස ද වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය (142 වන අධිකාරිය වන) අනන්ද්‍රරු ආඥාපනත හා අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1A - PG 4204 — 107 (2018/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ප්‍රඥප්ති නාමය ක්‍රියාත්මක වන දිනය

01. මේ ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ 2018 අංක 04 දරන ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ පසු විෂයභාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයක දී ක්‍රියාත්මක වන්නේය.

ළමා සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම සඳහා වූ නියමය

02. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමේ දින සිට හා ඉන් පසුව තත්කාර්ය සඳහා මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි නොවී උපතේ සිට වයස අවුරුදු දහඅට දක්වා වූ අනාථ, අත්හල, අසරණ සහ අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයි සඳහා පළාත තුළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන නොයා යුතුය.

ළමා සංවර්ධන මධ්‍යස්ථාන පරිපාලනය සඳහා වූ වගකීම

03. මෙම ප්‍රඥප්තිය යටතේ වූ කාර්යය ඉටු කිරීම සඳහා වූ නෛතික අධිකාරියද, මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වූ සියලුම ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීමේ වගකීමද (මෙහි මින් මතු,කොමසාරිස් යනුවෙන් සඳහන් කරනු ලබන) මධ්‍යම පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් වෙත පැවරෙන්නේය.

ලියාපදිංචි වීම සඳහා

04. මෙම ප්‍රඥප්තිය යටතේ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කරනු ලැබීමට සුදුසු වීම සඳහා අවශ්‍ය සුදුසුකම් පහත දක්වා ඇති පරිදි වේ.

(අ) ඉල්ලුම්කරු ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවා පවත්වාගෙන යාම තත් සංවිධානයේ ව්‍යවස්ථාවේ එක් පරමාර්ථයක් වශයෙන් ඇති ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ස්වේච්ඡා සංවිධානයක් විය යුතුය.

(ආ) ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා ආණ්ඩුව සහ වෙනත් යම් ප්‍රභවයන්ගෙන් ලබාගන්නා වූ සියලු මුදල් විශේෂ බැංකු ගිණුමකට බැර කරනු ලැබිය යුතු අතර යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය නමින් පවත්වාගෙන යා යුතුය.

(ඇ) යෝජිත ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය පරිපාලනය කිරීම සඳහා සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු, ලේකම්වරයෙකු, උප ලේකම්වරයෙකු භාණ්ඩාගාරිකවරයෙකු සහ කළමනාකරුවෙකු ඇතුළු අවම සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් තිබිය යුතු ය.

(ඈ) සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික සහ කළමනාකරු ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.

සහ

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තුන් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් එකී යෝජිත ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීමට අපේක්ෂිත අවස්ථාවෝචිත පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

(ඊ) ඉල්ලුම්කරුට යෝජිත ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නෛතික අයිතිය තිබිය යුතු අතර එකී මධ්‍යස්ථානයේ සියලු චංචල සහ නිශ්චල දේපලවල භුක්තිය තිබිය යුතුය.

(උ) ඉල්ලුම්කරු මෙම ප්‍රඥප්තිය 4 වන උපලේඛනයේ දක්වා ඇති පරිදි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා නියමිත වන්නා වූ අවම ප්‍රමිති සපුරා තිබිය යුතුය.

ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා වූ තාවකාලික අනුමැතිය

05. (1) පළාත තුළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීමට අභිලාශයක් දක්වන්නා වූ යම් ස්වේච්ඡා සංවිධානයක් විසින් මේ ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ නිශ්චිතව සඳහන් සියලු සුදුසුකම් සපුරාලන්නාවූ අවස්ථාවක දී එකී යෝජිත මධ්‍යස්ථානයේ කළමනාකරු වශයෙන් කටයුතු කිරීම සඳහා පවරනු ලැබූ තැනැත්තා විසින් අත්සන් කරනු ලැබූ සහ මෙම ප්‍රඥප්තියේ I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙල කරනු ලැබූ ඉල්ලුම්පත්‍රයක් මගින් එකී ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීම පිණිස තාවකාලික අනුමැතියක් සඳහා ඉල්ලුම් කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ තාවකාලික අනුමැතිය සඳහා වූ ඉල්ලුම් කිරීමක් ලැබීමෙන් පසු, අවශ්‍ය විය හැකි පරිදි වූ පරීක්ෂණයන් පවත්වා තමා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලයක් තුළ ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කොමසාරිස්වරයා විසින් පරිවාස නිලධාරියාට හෝ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ප්‍රමාණවත් පළපුරුද්දක් ඇත්තාවූ සහ ඒ සඳහා බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධාරියකුට වහාම නියම කරනු ලැබිය යුතුය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් වාර්තාවක් මගින් වෙනත් කාරණා ඇතුලුව ලියාපදිංචි කරනු ලැබීමට සුදුසුවීම සඳහා ඉල්ලුම්කරු (4) වන වගන්තියේ සඳහන් සියලු සුදුසුකම් නිශ්චිතව සපුරාලන්නේද යන්න ප්‍රකාශ කරනු ලැබිය යුතුය.

06. (1) කොමසාරිස්වරයා විසින් 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තාවේ අන්තර්ගතය පරීක්ෂා කිරීමෙන් පසුව — පූර්ව අනුමැතිය ප්‍රදානය කිරීම.

සහ

(අ) එකී යෝජිත ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීමට අපේක්ෂිත ප්‍රදේශය සහ ඒ වන විටත් පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය හේතුවෙන් ඒ ප්‍රදේශය තුළ අලුත් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීමට ඇති අවශ්‍යතාවය නිශ්චය කරනු ලැබීමෙන් පසු

(ආ) යෝජිත ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීමට අපේක්ෂිත පරිශ්‍රයට පුද්ගලිකව යාමේදී රැස්කරගනු ලැබූ වෙනත් තොරතුරුද සැලකිල්ලට ගැනීමෙන් පසු,

(ඇ) යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීමේ දී මහජන අදහස් ලබා ගැනීම පිණිස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හා ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි කාර්යාලයේ දැන්වීමක් ප්‍රකාශ කොට, දින 14 ක් ඇතුළත මහජන අදහස් හා යෝජනා සැලකිල්ලට ගැනීමෙන් පසුව, ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා ඉල්ලා සිටිනු ලබන ස්වේච්ඡා සංවිධානයට තාවකාලික අනුමැතිය ප්‍රදානය කළ යුතුද නැතහොත් නොකල යුතුද යන්න පිළිබඳව තීරණයකට එළඹිය යුතුය.

(2) කොමසාරිස්වරයාට ලැබුණු යම් ඉල්ලුම් කිරීමක් මත දෙනු ලබන තීරණය එකී ඉල්ලීම ලැබීමෙන් මාස තුනක් ඇතුළත දියයුතු අතර කොමසාරිස්වරයා විසින්

(අ) අනුමැතිය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරන්නේනම් එකී ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු දක්වමින් ඒ බව ඉල්ලුම්කරුට දන්වනු ලැබිය යුතුය.

හෝ

(ආ) අනුමැතිය දීමට තීරණය කරන්නේ නම්, මේ ප්‍රඥප්තියේ II වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරාණුකූල වූ තාවකාලික අනුමැති සහතිකයක් ඉල්ලුම්කරුට නිකුත් කරනු ලැබිය යුතුය.

(3) (5) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ නිකුත් කරනු ලැබූ තාවකාලික අනුමැති සහතිකය අමාත්‍යවරයා විසින් තත් කාර්ය සඳහා කලින් කල නියම කරනු ලැබිය හැකි නියමයන් හා කොන්දේසි වලට යටත් විය යුතු අතර නිකුත් කරනු ලබන දින සිට මාස හයක (06)කාලයක් සඳහා වලංගු විය යුතුය.

07. (1) 6 වන වගන්තිය යටතේ තාවකාලික අනුමැති සහතිකයක් ප්‍රදානය කරනු ලැබූ තැනැත්තෙකු විසින් එකී සහතිකයේ වලංගු කාල පරිච්ඡේදය ඉකුත් වීමට පෙර එයට අදාළ වූ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවිය යුතු බව නියම වන අතර පිහිටුවා නිම කළ බවට වූ වාර්තාවක් එකී ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය, මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ලියාපදිංචි කිරීම පිණිස වන ඉල්ලුම් පත්‍රයක් ද සමග ඉදිරිපත් කළ යුතුය. — ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රදානය කරනු ලබන වලංගු කාල පරිච්ඡේදය තුළ සම්පූර්ණ කල යුතු බව

(2) (1) වන උපවගන්තියේ සඳහන් මාස හයක කාලපරිච්ඡේදය ඇතුළත ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය සම්පූර්ණ කිරීමට තාවකාලික අනුමැති සහතිකය නිකුත් කරනු ලැබූ සංවිධානයට නොහැකි වන විටෙක ඒ සංවිධානය විසින් ඒ සම්බන්ධයෙන් කොමසාරිස්වරයාට ලිඛිත අභියාචනයක් කළහොත් අතිරේක මාස 6 ක උපරිම කාලයක් දක්වා වැඩිදුරටත් ඒ සංවිධානයට ප්‍රදානය කරනු ලැබිය හැකිවේ.

08. (1) (7) වන වගන්තිය අනුව (1) වන උපලේඛනයේ සඳහන් වාර්තාව ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් කිරීම ලැබීමෙන් මාසයක් ඇතුළත කොමසාරිස්වරයාට තමා විසින්ම හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු මගින් — ස්වේච්ඡ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම

(අ) තාවකාලික අනුමැති සහතිකය නිකුත් කිරීමේ සිට එකී මධ්‍යස්ථානයට ඇතුළත් කරනු ලැබූ ළමයින්ගේ යහපත සහතික වන ආකාරයට අදාළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට එයට ශක්නුතාවක් තිබේද යන්න,

සහ

(ආ) ඒ නිසා එකී මධ්‍යස්ථානය මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතුද යන්න නිශ්චය කිරීම පිණිස කොමසාරිස්වරයා විසින් අවශ්‍ය සහ උචිත ලෙස සලකනු ලබන පරීක්ෂණ සහ පරීක්ෂාවන් කරනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරගෙන යනු ලැබූ පරීක්ෂණ හා පරීක්ෂාවන් නිම කිරීමෙන් පසු කොමසාරිස්වරයා විසින් -

(අ) එකී මධ්‍යස්ථානය ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ලියාපදිංචි කොට මේ ප්‍රඥප්තිය iii වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියකට සාරාණුකූල වූ ලියාපදිංචි වීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතුය.

(ආ) එකී මධ්‍යස්ථාන ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ලියාපදිංචි කිරීම 10 වන වගන්තියේ සඳහන් යම් එක් හේතුවක් හෝ එකකට වැඩි හේතු මත ප්‍රතික්ෂේප කොට එකී ප්‍රතික්ෂේප කිරීමට හේතු ප්‍රකාශ කරනු ලැබිය යුතුය.

(3) (2) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ නිකුත් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකයක එය නිකුත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා වලංගු විය යුතු අතර, අමාත්‍යවරයා විසින් එකී කාර්යය සඳහා කලින් කල නියම කරනු ලැබිය යුතු පරිදි වූ නියමයන් හා කොන්දේසිවලට යටත් විය යුතුය.

(4) කොමසාරිස්වරයා විසින් මේ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ලියාපදිංචිය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක ඒ වන විටත් අදාළ සංවිධානයට නිකුත් කරනු ලැබ ඇති තාවකාලික අනුමැති සහතිකය, එය ක්‍රියාත්මකව පවතින්නේ නම් අවලංගුභාවයට පත්විය යුතු අතර එකී මධ්‍යස්ථානයට ඇතුළත් කරගනු ලැබ තිබිය හැකි වූ අනාථ,අත්හල,අසරණ හා අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයි කෙරෙහි මේ ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කරගත යුතුය.

ලියාපදිංචි කිරීමේ දිනයට සහතිකය අලුත් කිරීම.

09. ලියාපදිංචි කිරීමේ සහතිකයක්, එකී සහතිකයේ වලංගු කාල පරිච්ඡේදය ඉකුත් වීමේ දිනයට පෙරාතුව වූ මාස තුන ඇතුළත ඒ සඳහා ඉල්ලුම් කිරීමේදී අලුත් කල හැකි අතර,එවැනි අලුත් කිරීමක් පිළිබඳව මේ ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම සහිතව අදාළ කර ගත යුතුය.

ලියාපදිංචි කිරීමක් ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු.

10. (1) ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් 7 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් වශයෙන් ලියාපදිංචි කිරීම ඉල්ලුම් කිරීමක් පහත දක්වා ඇති කවර හෝ හේතුමත, එනම්.

(අ) අදාළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය පරිපාලනය කොට පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් ඉල්ලුම්කරුට නොමැති බවට හෝ එකී මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් ලබා ගැනීමට ඉල්ලුම්කරුට හැකියාවක් නොමැති බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක.

(ආ) ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ වාසය කරන අනාථ,අත්හළ හෝ අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයින්හට අධ්‍යාපනය හෝ වෙනත් යම් පුහුණුවීම් වාසස්ථාන පහසුකම් භාරකාරත්වය,ආරක්ෂාව සහ නඩත්තුව සැලසීමට හෝ ඒවා සැලසීම සඳහා අවශ්‍ය වූ ප්‍රමාණවත් සම්පත් ලබා ගැනීමට ඉල්ලුම්කරු අපොහොසත්ව ඇති බවට කොමසාරිස්වරයා සෑහිමට පත්වන අවස්ථාවක,

(ඇ) ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරු හෝ එකී මධ්‍යස්ථානයේ ස්වෙච්ඡා තත්වයෙන් කටයුතු කරන යම් තැනැත්තෙකු හෝ එකී මධ්‍යස්ථානය වෙනත් යම් සේවා නියුක්තිකයෙකු හෝ එකී මධ්‍යස්ථානය පරිපාලනය කිරීමේලා කටයුතු කරන වෙනත් යම් තැනැත්තෙකු අධිකරණය මගින් සිවිල් හෝ අපරාධ වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තෙකු බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක,

(ඈ) ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ සේවයේ නියුක්තව සිටින හෝ වැඩ කරන යම් තැනැත්තෙකුගේ ප්‍රසිද්ධිය හෝ චරිතය කෙසේද යත්,එකී මධ්‍යස්ථානයේ ස්වේච්ඡාවෙන් සේවයේ නියුක්තව සිටීම හෝ වැඩ කිරීම සඳහා හෝ එකී මධ්‍යස්ථානයේ වාසය කරන අනාථ,අත්හළ, අසරණ හා අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයින් සමග වැඩ කටයුතුවල යෙදීමේදී ආශ්‍රිතව ක්‍රියා කිරීමට ඒ මගින් ඔහු හෝ ඇය නුසුදුස්සකු වන බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක,

(ඉ) අදාළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය අමාත්‍යවරයා විසින් II වන වගන්තිය යටතේ ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් සඳහා නිශ්චිතව සඳහන් කොට ඇති අවම ප්‍රමිති පවත්වාගෙන යාමට එකී ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට නොහැකි බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක

හෝ

(ඊ) අමාත්‍යවරයා විසින් ගැසට්පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි වූ පරිදි වෙනත් යම් හේතු මත

කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි වේ.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පතක් සම්බන්ධයෙන් එකී ප්‍රතික්ෂේප කිරීම කරන ලද දින සිට දින 30ක් ඇතුලත විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත්තේය. එකී අභියාචනය සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වේ.

11. ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යා යුතු අවම ප්‍රමිතීන් අමාත්‍යවරයා විසින් වරින්වර ගැසට්පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් නිශ්චිතවසඳහන් කළයුතු අතර එසේ නිශ්චිතව සඳහන් කරනු ලබන සියලු ප්‍රමිති සමග දැඩි අනුකූලතාවය දැක්වීම සෑම ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයකම වගකීම වන්නේය.

ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලැබිය යුතු අවම ප්‍රමිතීන්

12 (1) කොමසාරිස්වරයා විසින් මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා පළාත තුළ ඇති ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල පරීක්ෂකවරයකු හෝ පරීක්ෂකවරුන් ලෙස පරිවාස නිලධාරින් නමින් හෝ ධුරයෙන් යම් රජයේ නිලධාරියෙකු හෝ නිලධාරීන් පත් කරනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලබන පරීක්ෂකවරයකු විසින් තම කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීමේදී කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි වූ යම් අවවාද උපදෙස් හා නියෝග මත ක්‍රියා කළ යුතු අතර ඔහුගේ අධිකාරියට යටත්විය යුතුය.

පරීක්ෂකවරයෙක් පත්කිරීම සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම, අධීක්ෂණය කිරීම.

13. කොමසාරිස්වරයා විසින් හෝ 12 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ පරීක්ෂකවරයකු හෝ පරීක්ෂකවරුන් විසින් කවර හෝ වේලාවක ස්වේච්ඡා ළමාසංවර්ධන මධ්‍යස්ථානයට ඇතුලු වී එය පරීක්ෂා කරනු ලැබිය හැකි අතර ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පිළිවෙළ,එය කළමනාකරණය කරනු ලබන ආකාරය, එහි පවත්නා තත්වය ළමයින් බලාකියා ගන්නා අයුරු සහ එකී ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නිවසන එක් එක් ළමයා සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන වාර්තා පරීක්ෂා කිරීමද ඇතුලුව එකී සංවර්ධන මධ්‍යස්ථානයේ නිවසන අනාථ,අත්හළ,අසරණ, හෝ අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයිගේ යහපත සහතික කිරීම පිණිස අවශ්‍ය වන්නේ යැයි, ඔහු හෝ ඇය විසින් සලකනු ලබන යම්කාරණා පිළිබඳව පරීක්ෂණයක්ද කළ හැකි ය.

ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම.

14. (1) කවර හෝ ළමයකු

(අ) කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව හා

සහ

(ආ) යම් ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක්, ලියාපදිංචි කල ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ලියාපදිංචි කරනු ලැබූ වේලාවේදී කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ වයස් සීමා, ස්ත්‍රී පුරුෂභාවය,ආගමික මෙහෙයවීම් මත පදනම්වූ යම් වර්ගීකරණයක් හෝ වෙනත් යම් සාධක උල්ලංඝනය වන ආකාරයෙන් ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ඇතුලත් කිරීම නොකළ යුතුය.

ලියාපදිංචිකල ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ළමයින් ඇතුලත් කිරීම හා කළමණාකරුගේ කාර්ය භාර්ය

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද ඒ ළමයා ඔහුගේ හෝ ඇයගේ ජීවිතය අනතුරකට පත්විය හැකි අවස්ථාවකට හෝ ජීවිතයට හානියක් සිදුවීමේ තර්ජනයකට හෝ ජීවිතයට තර්ජනයක් සිදුවීමේ හෝ තම සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට තර්ජනයක් සිදුවීමේ අවස්ථාවකට හෝ මුහුණ පාන බව දැනගන්නට ලැබු විටෙකදී එකී ළමයා කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව ලියාපදිංචි කල ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ඇතුලත් කරගත හැකි අතර එසේ වුවද එවැනි මධ්‍යස්ථානයකට ළමයා ඇතුලත් කිරීමෙන් සති දෙකක් ඇතුලත එකී මධ්‍යස්ථානයේ කළමණාකරු විසින් කොමසාරිස්වරයාගෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය.

කොමසාරිස්වරයාට වාර්තා සැපයීම.

15. (1) මේ ප්‍රඥප්තියේ iv උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ තොරතුරු වාර්තාවක් සෑම මාස තුනකට වරක් කොමසාරිස්වරයාට ඉදිරිපත් කිරීමට ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමනාකරු කටයුතු කළ යුතුය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන දැන්වීමක් මගින්,යම් ලියාපදිංචි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පරිපාලනය කිරීමට අදාල වූ යම් විශේෂ කාරණයක් සම්බන්ධ වාර්තාවක් සපයන ලෙස හෝ එවැනි ළමා සංවර්ධන මධ්‍යස්ථානවල වාසය කරන යම් අනාථ, අත්හල, අසරණ හෝ අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයින්ගේ උපරිම යහපත සහතික කිරීම සඳහා අවශ්‍ය වන්නේ යැයි සලකනු ලබන යම් තොරතුරක් සපයන ලෙස එකී ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරුගෙන් ඉල්ලා සිටීමට කොමසාරිස්වරයාට හෝ ඒ සඳහා කොමසාරිස්වරයා විසින් බලය දෙනු ලබන වෙනත් නිලධාරියකුට බලය තිබෙන අතර එකී දැන්වීමේ සඳහන් කාල පරිච්ඡේදය ඇතුලත අවස්ථාවෝචිත පරිදි එකී වාර්තාව හෝ තොරතුරු සැපයීමට එකී කළමනාකරු කටයුතු කළ යුතුය.

ලියාපදිංචි කල ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් හරහා ළමයින් මාරු කිරීම.

16. (1) යම් ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක වාසය කරන යම් අනාථ, අත්හල,අසරණ හෝ අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයෙකු මාරු කරනු ලැබීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් දෙනු ලබන යම් නියෝග හෝ උපදේශ සමග අනුකූලව කළමනාකරු කටයුතු කළයුතු අතර එකී ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක වාසය කරන කවර හෝ අනාථ, අත්හල, අසරණ හෝ අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයෙකු කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව කවර හෝ ආකාරයකින් වෙනත් ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා නිවාසයකට මාරු කිරීම හෝ එකී ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයෙන් ඉවත් කිරීම හෝ නොකළ යුතුය.

(2) ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක ස්ථාපන කමිටුව විසින් යම් ළමයෙකු අවුරුදු තුනකට වැඩි කාලයක් එකී මධ්‍යස්ථානයේ තබා ගැනීමට තීරණය කරනු ලබන අවස්ථාවක එකී තීරණය කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව ක්‍රියාත්මක නොකළ යුතුය.

කොමසාරිස්වරයා විසින් සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කිරීම.

17. (1) කොමසාරිස්වරයා විසින්,

(අ) ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පාලනය කරනු ලබන ආකාර සතුටුදායක නොවන බව.

(ආ) එවැනි මධ්‍යස්ථානවල සිටින ළමුන්ට ලබාදී ඇති වාසස්ථාන පහසුකම් නිවස්නා ළමුන්ගේ සුබසිද්ධිය සඳහා ප්‍රමාණවත් හෝ උපකාරී නොවන බව.

(ඇ) එවැනි මධ්‍යස්ථානවල ළමුන් රැකබලාගන්නා අන්දම,ඒවායේ නිවස්නා අනාථ,අත්හල, අසරණ හෝ අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයින්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇති කරන බව,

(ඈ) මේ ප්‍රඥප්තියේ II වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන අවම ප්‍රමිති පවත්වාගෙන නොයන බව,

හෝ

(ඉ) 8 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නියම කරනු ලබන නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා නොකරන බව, කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක,එකී තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගතයුතු පියවර පිළිබඳව එකී ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලයට සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කිරීමට කොමසාරිස්වරයාට බලය ඇත්තේය.

(2) (1) වන උපවගන්තිය යටතේ විධානයක් නිකුත් කරනු ලැබුවේ යම් කළමනාකරන මණ්ඩලයකටද, එකී කළමනාකරණ මණ්ඩලය විසින් එකී විධාන පිළිපැදීම, එකී මණ්ඩලයේ කාර්යය විය යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ යම් සාමාන්‍ය හෝ විශේෂ විධානයන්,

(අ) කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයාට ලියාපදිංචි තැපෑලෙන් යැවීම උචිත අවස්ථාවන්හිදී ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි මගින් ඔහුට භාරදීම හෝ කළ යුතුය.

හෝ

(ආ) මධ්‍යස්ථානයේ යම් ගොඩනැගිල්ලක කැපී පෙනෙන ස්ථානයක ඇලවිය යුතුය.

(4)(1) වන උපවගන්තිය යටතේ යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කරනු ලැබූ ස්වේච්ඡා ළමා රැකවරණ මධ්‍යස්ථානයේ යම් කළමනාකරුවකු හෝ කළමනාකරණ මණ්ඩලයක් හෝ විසින් එකී විධාන පිළිපැදීමට අපොහොසත් වන අවස්ථාවක ඒවාට අනුකූල වීම සහතික කරලීම සඳහා නිසි බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයකට ඉල්ලීමක් කිරීමට කොමසාරිස්වරයාට බලය ඇත්තේය.

18. (1). 17වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් මහෙස්ත්‍රාත්වරයෙකුට ඉල්ලීමක් ඉදිරිපත් කළ පසු, එකී මහෙස්ත්‍රාත්වරයා විසින් කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්ට අධිකරණය ඉදිරියේ පෙනී සිට අදාළ ලියාපදිංචිය අවලංගු නොකළ යුත්තේ මන්දැයි කරුණු ඉදිරිපත් කරන ලෙසට නියෝග කළ යුත්තේය. අවලංගු කිරීමේ නියෝගය.

(2) (1) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කරනු ලබන දැන්වීමක් ලැබීමෙන් පසු කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් එකී දැන්වීමේ සඳහන් දිනයේදී මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ පෙනී සිටීමට අපොහොසත් වුවහොත් හෝ ඉදිරිපත් වුවද ලියාපදිංචිය අවලංගු නොකල යුත්තේ මන්ද යන්න පිළිබඳව ප්‍රමාණවත් හේතු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් අදාළ ලියාපදිංචි කල ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ලියාපදිංචිය අවලංගු කරමින් නියෝගයක් නිකුත් කිරීමට මහෙස්ත්‍රාත්වරයාට බලය ඇත්තේය.

(3) ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක ලියාපදිංචිය අවලංගු කරමින් (2) වන උපවගන්තිය යටතේ නියෝගයක් කරනු ලැබූ අවස්ථාවක, කොමසාරිස්වරයාට හෝ ඔහු විසින් ඒ සඳහා විධිමත් ලෙස පත්කරනු ලැබූ යම් තැනැත්තෙකුට හෝ 12 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ යම් පරීක්ෂකවරයෙකුට හෝ අදාළ මධ්‍යස්ථානයට ඇතුළුවී,

(අ) එකී මධ්‍යස්ථානයේ නිවස්නා අනාථ,අත්හල අසරණ හෝ අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමුන් පළාත තුල පිහිටි වෙනත් ලියාපදිංචි කල ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට මාරු කිරීම,

(ආ) ළමුන් ඔවුන්ගේ දෙමව්පියන්ට, භාරකරුවන්ට භාරදීම,

හෝ

(ඇ) කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ වෙනත් ස්ථානයකට ළමුන් මාරුකිරීම, සඳහා බලය තිබිය යුතුය.

19 (1) ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ ස්වේච්ඡාළමා සංවර්ධනමධ්‍යස්ථානයකට කිසිදු අනාථ, අත්හල,අසරණ හෝ අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයෙක් ඇතුළත් නොකළ යුතුය. ලියාපදිංචි කිරීමක් අවලංගු කිරීමේ ප්‍රතිඵලය.

(2) අවස්ථාවෝචිත පරිදි යම් ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ වේලාවේදී හෝ අවලංගු කිරීමේ නියෝගය අභියාචනයේදී ස්ථිර කරනු ලැබූ අවස්ථාවේදී අවස්ථාවෝචිත පරිදි එකී අවලංගු කිරීම හෝ නියෝගය ස්ථිර කිරීම නොතකා එකී ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසිකව සිටි යම් අනාථ, අත්හල, අසරණ හෝ අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයෙකුට හෝ ළමුන්ට එකී ළමයා හෝ ළමුන් (1) වන උපවගන්තිය යටතේ එකී මධ්‍යස්ථානයේ ඉවත් කරනු ලබන තෙක් භාරකාරත්වය,රැකවරණය සහ නඩත්තුව සැලසීම අදාළ මධ්‍යස්ථානයේ වගකීම විය යුතුය.

(3) ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට අවස්ථාවෝචිත පරිදි ආණ්ඩුව විසින් හෝ පළාත් සභාව විසින් ලැබීමට සලස්වන ලද සියලු ස්පර්ශ කළ හැකි හෝ නොකළ හැකි වත්කම් කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ වෙනත් ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට මාරු කිරීම සඳහා අවශ්‍ය සියලු කටයුතු කිරීමට කොමසාරිස්වරයාට හෝ ඒ සඳහා කොමසාරිස්වරයා විසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධරයෙකුට හෝ බලය තිබිය යුතුය.

පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන

20. (1) අමාත්‍යවරයා විසින් මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කිරීම හේතුවෙන් යම් ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයකින් ඉවත් කරනු ලැබිය හැකි යම් අනාථ,අත්හල, අසරණ හෝ අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයින් පිළිගැනීම සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන වෙත ඇතුළත් කිරීම සඳහා යොමු වන ළමුන් හඳුනාගෙන සුදුසු මධ්‍යස්ථාන වෙත ඇතුලත් කිරීමට තෝරා ගන්නා තෙක් ඔවුන්ට රැකවරණය,ආරක්ෂාව සහ නඩත්තුව සැලසීම සඳහා පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරනු ලැබිය යුතු පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පරිපාලනය කිරීම සහ නඩත්තු කිරීමේදී උපචිත වන සියලු වියදම් පළාත් සභාවේ පළාත් අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් මේ වගන්තිය යටතේ පිහිටුවන ලද පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් භාර කටයුතු කිරීම සඳහා මේට්‍රන්වරයකු නමින් හෝ ධූරයෙන් පත් කළ යුතු අතර එකී ළමා නිවාසය පරිපාලනය කිරීමට අවශ්‍ය වෙනත් නිලධාරීන් සහ සේවකයන් සංඛ්‍යාවක්ද පත් කරනු ලැබිය යුතුය.

පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක මේට්‍රන්වරයාගේ කාර්යභාරය.

21. (1) පළාත් ළමා සංවර්ධනමධ්‍යස්ථානයක මේට්‍රන්වරයා විසින් තම ධූරයේ කාර්යභාර,ඒ සඳහා එකී මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන යම් විධානවලට අනුකූලව සහ කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබියහැකි යම් නියෝග හෝ උපදේශවලට අනුකූලව ඉටු කරනු ලැබිය යුතුය.

(2) මේට්‍රන්වරයා විසින් පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථානයට ඇතුල් කරණු ලැබූ අනාථ,අත්හල අසරණ හෝ අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයින්ට ප්‍රමාණවත් භාරකාරත්වය,ආරක්ෂාව සහ නඩත්තු සැපයීම සහතික වීම පිණිස අවශ්‍ය සියලු පියවර ගතයුතු අතර,අවස්ථාවෝචිත පරිදි එකී ළමයින් එකී පළාත තුළ පිහිටි ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට මාරු කිරීමට හෝ එකී ළමයින් ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් වෙත භාරදීමට හැකි ඉක්මණින් කටයුතු කළ යුතුය.එසේ වුවද එකී ළමයින් යම් ලියාපදිංචි කල ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට මාරු කිරීමට මේට්‍රන්වරයා ක්‍රියාකරන අවස්ථාවකදී ඒ සඳහා ඔහු විසින් කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

සම්පත් ලබාදීම.

22. (1) යම් මූල්‍ය ප්‍රභවයන්ගෙන් හෝ පරිත්‍යාග මගින් ලබා ගන්නා යම් මුදල් හෝ අරමුදල්,මේ ප්‍රඥප්තිය මගින් හෝ ඒ යටතේ ඉටුකල යුතු ලෙස තමා වෙත භාර දී ඇති ක්‍රියාකාරකම් කරගෙන යාම සඳහා සහ කාර්යයන් ඉටු කිරීම සඳහා කොමසාරිස්වරයා විසින් භාවිතා කරනු ලැබිය හැකිය.භාවිතය සඳහා දෙනු ලබන මුදල් හෝ අරමුදල් එකී කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන විශේෂ ගිණුමකට බැරකළ යුතුය.

(2) කොමසාරිස්වරයා විසින්,මේ ප්‍රඥප්තිය යටතේ තම කාර්ය ඉටුකිරීම සඳහා ඔහුට හෝ ඇයට ලබාදෙන සියලු අරමුදල් පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වාගෙන යනු ලැබිය යුතුය.

ගිණුම් විගණනය

23. සෑම ලියාපදිංචි කල ළමා සංවර්ධන මධ්‍යස්ථානයක වාර්ෂික ආදායම් හා වියදම් ප්‍රකාශයද,ගිණුම්ද විගණනයරජයේ පිළිගත් විගණකවරයකු මගින් හෝ ආයතනයක් මගින් විගණනය කරනු ලැබිය යුතු අතර විගණන ගිණුම් වාර්තා වර්ෂය අවසන් වී තෙමසක් ඇතුලත කොමසාරිස්වරයාට ඉදිරිපත් කල යුතුය.

කොමසාරිස්වරයා විසින් කරනු ලබන සහන ගෙවීම්.

24. කොමසාරිස්වරයා විසින් ඒ සම්බන්ධයෙන් යම් ලියාපදිංචි කල ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමනාකරුවකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත,යම් ලියාපදිංචි කල ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක නිවැසි එක් එක් ළමයෙකු සම්බන්ධයෙන්,එකී ළමයාගේ ප්‍රතිලාභය වෙනුවෙන් භාවිත කළ යුතු සහන නඩත්තු දීමනාවක් වශයෙන් වාර්ෂිකව නිශ්චය කළ යුතු මුදල් ප්‍රමාණයක්,එක් එක් ලියාපදිංචි කළ ළමා නිවාසයක කළමනාකරුට ගෙවනු ලැබිය හැකිය.

25. (1) ලියාපදිංචි කරන ලද එක් එක් ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන සම්බන්ධයෙන් තත්කාර්ය සඳහා එකී මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන ස්වේච්ජා සංවිධානයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී පත් කරනු ලැබූ පිළිගත් විගණකවරයා විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශයක් පිළියෙල කළ යුතු අතර එසේ පිළියෙල කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශය එකී සංවිධානයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී සම්මත කොට ගත යුතුය. ළමා සංවර්ධන මධ්‍යස්ථානයක වාර්ෂික මූල්‍යප්‍රකාශය.

(2) පලමුවන උප වගන්තිය යටතේ පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශය අදාල ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා නිවාසයේ කළමනාකරු විසින් එක් එක් වර්ෂයේ මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කල යුතුය.

26. (1) අමාත්‍යවරයා විසින් මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ සහ බලාත්මක කිරීමේ කාර්ය සඳහා නියෝග සාදනු ලැබිය හැකිය. නියෝග.

(2) (1) වන උපවගන්තිය මගින් පිරිනමනු ලබන බලතලවල පොදු භාවයට අගතියක් නොවන පරිදි අමාත්‍යවරයා විසින් පහත සඳහන් සියලු හෝ එක් කාරණයක් හෝ සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය.

(අ) මේ ප්‍රඥප්තිය යටතේ නියෝග සෑදීම සඳහා නියමිත හෝ බලය දෙනු ලබන සියලු කාරණා,

(ආ) පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන හා, ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා නියමිත වන්නා වූ අවම ප්‍රමිතීන්.

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබූ වාර්තාවල ඇතුළත් කළ යුතු තොරතුරු,

(ඈ) කොමසාරිස්වරයා විසින් තැබිය යුතු සහ පවත්වාගෙන යායුතු පොත්පත් සහ නාම ලේඛන සහ ඒවායේ ඇතුළත් කළ යුතු විස්තර,

(ඉ) ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම සඳහා වූ පටිපාටිය.

(ඊ) අනාථ, අත්හල අසරණ හෝ අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයින් ලියාපදිංචි කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ඇතුළත් කරනු ලබන්නේ කවර අවස්ථානුගත කාරණා යටතේද,එකී කාරණා සහ,

(උ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන බලාත්මක කිරීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් කාරණා,

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සියලු නියෝග ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ ගැසට් පත්‍රයේ පල කිරීමෙන් මාස තුනක් ඇතුළත පළාත් සභාවට ඉදිරිපත් කොට එකී පළාත් සභාව මගින් අනුමත කරවා ගනු ලැබිය යුතුය.

(4) පළාත් සභාවක් විසින් එසේ අනුමත නොකරන ලද සෑම නියෝගයක්ම, එය යටතේ කලින් කරනු ලැබූ කිසිවකට අගතියක් නොවන පරිදි එකී අනනුමත දින සිට පරිච්ජින්න වූවාසේ සැලකිය යුතුය.

27. මේ ප්‍රඥප්තිය යටතේ, ප්‍රඥප්තිය උල්ලංඝනය වන පරිදි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම හෝ යටතේ පවත්වාගෙන යාම වරදක් බව

(අ) තත්කාර්ය සඳහා තාවකාලික අනුමැති සහතිකයක් ලබා නොගෙන ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවන හෝ නිකුත් කරන ලද තාවකාලික අනුමැති සහතිකය අවලංගු කිරීමෙන් පසුවද ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස අදාළ මධ්‍යස්ථානය පවත්වාගෙන යන,

(ආ) තාවකාලික අනුමැති සහතිකය වලංගු කාල පරිච්ජේදය අවසන් වීමෙන් පසු මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කල ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ලියාපදිංචි නොවී යම් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබන හෝ පරිපාලනය කරනු ලබන,

(ඇ) තත් මධ්‍යස්ථානයේ ලියාපදිංචිය අවලංගු කිරීමෙන් පසුව ද ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස දිගටම ක්‍රියාත්මක කරනු ලබන,යම් තැනැත්තෙකු හෝ කළමනාකරණ මණ්ඩලයක් මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේදී රුපියල් පන්ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා වූ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත්වීම හෝ වැරදි ප්‍රකාශ කිරීම වරදක් බව.

28. (1) මේ ප්‍රඥප්තිය යටතේ ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබූ හෝ ඉල්ලා සිටිනු ලැබූ යම් තොරතුරක් හෝ වාර්තාවක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ එසේ කිරීම කරන තැනැත්තෙකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරුවන අතර මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේදී,

(අ) එම වරද පළමුවරට කරනු ලබන අවස්ථාවකදී රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට,

සහ

(ආ) එකී වරද දෙවන වරට හෝ ඉන්පසුව කරනු ලබන අවස්ථාවකදී රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට හෝ වසර දෙකක් නොඉක්මවන කාලයක් සඳහා වූ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම්දෙකටම,

හෝ,

එකී තැනැත්තා යටත් විය යුතුය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ දැනදැනම යම් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරනු ලබන හෝ එය යටතේ සාදන ලද යම් වාර්තාවක හෝ ඉල්ලුම්කිරීමක සාවද්‍ය හෝ වැරදි ප්‍රකාශයක් දැන දැනම කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කිරීමේදී,

(අ) එකී වරද පළමු වරට කරනු ලබන අවස්ථාවකදී රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට

සහ

(ආ) එකී වරද දෙවන වරට හෝ ඉන්පසුව කරනු ලබන අවස්ථාවකදී රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට හෝ වසර දෙකක් නොඉක්මවන කාලයක් සඳහා වූ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ, එකී තැනැත්තා යටත් විය යුතුය.

කොමසාරිස්වරයාට බාධා කිරීම ආදිය වරදක් බව.

29. මේ ප්‍රඥප්තිය යටතේ,කොමසාරිස්වරයා වෙත හෝ පරීක්ෂකවරයකු හෝ වෙත පනවන ලද යම් කාර්යයක් ඉටු කිරීමේදී එකී කොමසාරිස්වරයා,පරීක්ෂකවරයා හෝ කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධාරියකු එසේ කිරීමෙන් වලක්වන හෝ එවැන්නෙකුට බාධා කරන යම්තැනැත්තකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේදී රුපියල් විසිපන්දහසක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ එකී තැනැත්තා යටත් විය යුතුය.

සාමාන්‍ය දණ්ඩන

30. මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදනු ලබන යම් නියෝගයක විධිවිධාන හෝ උල්ලංඝනය කරමින් කටයුතු කරන යම්තැනැත්තෙකු මේ ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරනු ලබන අතර එකී වරද මේප්‍රඥප්තිය මගින් විශේෂයෙන් දණ්ඩනයක් සලකනු නොලැබ ඇති වරදක් වන අවස්ථාවක දී මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේදී, රුපියල් දසදහසක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

කළමනාකරණ මණ්ඩල විසින් කරනු ලබන වැරදි

31.මේ ප්‍රඥප්තිය යටතේ වූ වරදක් යම් කළමනාකරන මණ්ඩලයක් විසින් කරනු ලබන විටකදී, එකී කළමණාකරන මණ්ඩලය,

(අ) අවස්ථාවොචිත පරිදි යම් ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පරිපාලනය කරනු ලබන කළමණාකරන මණ්ඩලයක් වන්නේ නම් එකී කළමණාකරන මණ්ඩලයේ සෑම සාමාජිකයකුම හෝ,

(ආ) සංස්ථාගත මණ්ඩලයක් නම් එකී සංස්ථාගත මණ්ඩලයේ සෑම, අධ්‍යක්ෂවරයකුම කළමණාකාරවරයකු, ලේකම් හෝ නිලධාරියකු හෝ,

(ඇ) යම් හවුල්කාර ව්‍යාපාරයක් වන්නේ නම් එකී හවුල්කාර ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම සහ කළමණාකරුවකු ම හෝ ;

විසින් එකී වරද සිදු කරන ලද්දේ තමන්ගේ කැමැත්ත හෝ එකගතාවය නොමැතිව බවද,එකී වරද සිදු කිරීම වැලැක්වීම සඳහා ඔහු හෝ ඇය විසින් හැකි සියලු නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බවද සාධනය කරන්නේ නම් මිස, එකී වරදට එක්ව හා තනි තනිව වරදකරු විය යුතුය.

32. මේ ප්‍රඥප්තිය යටතේවූ යම් වරදක් යම් ලියාපදිංචි කල ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමනාකරුවකු, කළමණාකරන මණ්ඩලයේ සාමාජිකයකු හෝ එවැනි මධ්‍යස්ථානය සේවක මණ්ඩලයේ සාමාජිකයෙකු හෝ විසින් සිදු කරනු ලබන අවස්ථාවකදී එවැනි වරදක් සඳහා නිශ්චිතව සඳහන් කොට ඇති දණ්ඩනයට අමතරව එකී ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ප්‍රදානය කරනු ලැබ ඇති ලියාපදිංචිය මහේස්ත්‍රාත්වරයා විසින් අවලංගු කිරීම නීත්‍යානුකුල වන්නේය. කළමනාකරුවකු ආදී තැනැත්තන් වරදක් කළ අවස්ථාවකදී, අමතර දණ්ඩනනියම කළ යුතු බව

33. යම් රෝහලක් තුළදී උප්පත්තිය ලද යම් අනාථ හෝ අත්හල ළමයකු ලෙස හඳුනාගත් ළමයකු එකී රෝහලින් මුදා හැරීමට පෙර එකී ළමයාගේ උපත ලියාපදිංචි කිරීම සහතික කිරීම පිණිස අවශ්‍ය වූ සියලු මූලික පියවර ගැනීම එකී රෝහලේ අධ්‍යක්ෂකවරයාගේ හෝ ඒ සඳහා බලයලත් වෙනත් යම් නිලධාරියකුගේ කාර්යය විය යුතුය. එවැනි උපතක් දැනුම් දීම රෝහලේ අධ්‍යක්ෂවරයාගේ හෝ ඒ සඳහා බලය ලත් වෙනත් යම් නිලධාරියකුගේ කාර්යය විය යුතුය. එවැනි උපතක් නිසි පරිදි ලියාපදිංචි කිරීමෙන් පසු ඒ බව කොමසාරිස්වරයාට වහාම දැනුම් දීම රෝහලේ අධ්‍යක්ෂවරයාගේ කාර්යය විය යුතු අතර එකී ළමයා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරනු ලබන පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ඇතුළත් කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනීම ද එකී අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේය. උපතක් ලියාපදිංචි කිරීම.

34. පළාත තුළ පිහිටි පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ඇතුළත් කරනු ලබන සෑම ළමයකු සම්බන්ධයෙන්ම, එවැනි ළමයකු එසේ ඇතුළත් කළ දින සිට දින තිහක් ඇතුළත, එකී ළමයාට අදාළ සියලු තොරතුරු පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් කොමසාරිස්වරයාට ඉදිරිපත් කිරීම අදාළ ස්ථානභාර පරිවාස නිලධාරියාගේ හෝ ඒ සඳහා කොමසාරිස්වරයාගෙන් බලයලත් නිලධාරියාගේ හෝ කාර්යය විය යුතුය. පරීක්ෂණ වාර්තාවක්.

35. පළාත ඇතුළත පිහිටි යම් පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ඇතුළත් කරනු ලැබූ ළමයෙකු ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් වූ සියලු කාර්යය ඉටු කිරීම කොමසාරිස්වරයාගේ කාර්යය වන අතර එකී කාර්යය ඉටු කිරීමේදී ඔහුට ස්ථාපන කමිටුවේ සහාය ලබාගත හැකි වන්නේය. ළමයෙකු ස්ථානගත කිරීම

36. පළාත තුළ ස්ථාපිතව ඇති යම් ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචි වී ඇති බව නොතකා, ඒ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන මේ ප්‍රඥප්තියේ අර්ථය තුළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් වන්නේ නම්, එකී මධ්‍යස්ථානය මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කිරීමට නියම කරනු ලැබිය යුතුය. මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වීම සඳහා ඇති අවශ්‍යතාවය.

37. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස අර්ථ නිරූපනය

"ළමයා" යන්නෙන් වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තෙකු අදහස් වේ.

" ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය "යන්නෙන් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ස්වෙච්ජා අරමුදල් වලින් නඩත්තු කරනු ලබන්නා වූ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් අදහස් වන අතර අනාථ,අත්හල හා අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයින් සඳහා වාසස්ථාන පහසුකම් සලසා දීම, ආරක්ෂාව ලබා දීම සහ භාරකාරත්වය බාර ගැනීම සිදුකරන්නා වූ වෙනත් සංවිධානයක්ද අදහස් වේ.

"පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථානය" යන්නෙන් මෙම ප්‍රඥප්තියේ 20 වගන්තිය අනුව පිහිටවනු ලබන පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින්, පරිපාලනය කරනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් අදහස් වේ.

" අනාථ" යන්නෙන් සුජාත ළමයෙකු සම්බන්ධයෙන් අදාළ කරගනු ලබන විට, මාපිය දෙදෙනාම මියගිය ළමයකු හෝ දෙමාපියන්ගෙන් එක් තැනැත්තකු මියගොස් ඇති සහ අනෙක් තැනැත්තාට මාපියකු ලෙස කටයුතු කිරීමට නොහැකි අවස්ථාවක එවැනි ළමයෙකු අදහස් වන අතර, අවජාතක ළමයෙකු සම්බන්ධයෙන් වන විට මව මියගිය ළමයෙකු අදහස් වේ.

"අත්හල"යන්නෙන් සුජාත ළමයෙකුට අදාළ කරනු ලබන විටදී මව හා පියා යන දෙදෙනා විසින් අත්හරිනු ලැබූ හෝ දෙමව්පියන්ගෙන් එක් තැනැත්තෙකු විසින් අත්හරිනු ලැබ අනෙක් තැනැත්තා මියගොස් ඇති,නැතහොත් දෙමව්පියෙකු ලෙස කටයුතු කිරීමට නොහැකි හෝ දෙමව්පිය දෙදෙනාටම දෙමව්පියන් ලෙස කටයුතු කිරීමට නොහැකි හෝ ළමයකු අදහස් වන අතර අවිවාහ ළමයෙකු සම්බන්ධයෙන් වන විට ඔහුගේ හෝ ඇයගේ මව විසින් අත්හරිනු ලැබ නැතහොත් මව ලෙස කටයුතු කිරීමට තම මවට නොහැකි වූ ළමයෙකු අදහස් වේ.

"අසරණ" යන්නෙන් මව හෝ පියා හෝ මියගිය දෙමාපියන්ගෙන් එක් අයකු විසින් අතහැර දමනු ලැබ හා අනෙක් තැනැත්තා දෙමාපියෙකු ලෙස කටයුතු කළ නොහැකි,භාරය හා ආරක්ෂාව අවශ්‍ය රජයේ දෙපාර්තමේන්තුවක් මගින් හෝ පළාත් පාලන ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලබන මහජන සහනාධාර ලබන දෙමව්පියන්ගේ ළමයෙකු, දෙමාපියන්ගෙන් කෙනෙකු වෛද්‍ය සහතිකයක් අනුව ආදායම් මාර්ගයන් ලබාගත නොහැකි රෝගී තත්වයක සිටින හා අනෙක් තැනැත්තා, තැනැත්තී (මව හෝ පියා ) ස්ථිර ආදායම් මාර්ගයක් නැති දෙමාපියන්ගෙන් කෙනෙකු බන්ධනාගාර ගතව සිටින හා අනෙක් තැනැත්තා, තැනැත්තී (මව හෝ පියා හෝ) ස්ථිර ආදායමක් නැති දෙමාපියන්ගෙන් කෙනෙකු වෛද්‍ය සහතිකයක් මත මානසික රෝගියකු යැයි නිශ්චය කර ඇති සහ අනෙක් තැනැත්තා,තැනැත්තී (මව හෝ පියා හෝ) ස්ථිර ආදායමක් නැති, උසාවි නියෝගයක් මත හෝ වෙනත් ආකාරයකින් දෙමාපියන් වෙන්වූ පවුලක ළමුන්ගේ භාරකාරත්වය දරන මවට හෝ පියාට හෝ ස්ථිර ආදායම් මාර්ගයක් නැති ළමයෙකු අදහස් වේ.

"අධිකරණ නියෝග මත භාරය හා ආරක්ෂාව අවශ්‍ය " යන්නෙන් 1939 අංක 48 දරන ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥාපනත යටතේ භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයෙකු අදහස් කෙරේ.

" පරීක්ෂකවරයා " යන්නෙන් 12 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් පත්කරනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථානයක පරීක්ෂකවරයකු අදහස් වේ.

"කළමනාකරු" යන්නෙන් ලියාපදිංචි කල ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමනාකරණය සම්බන්ධයෙන් වන විටදී එය පිහිටුවීමෙන් පසු එහි කළමනාකරු ලෙස පත්කිරීමට යෝජිත හෝ පත්කල තැනැත්තා අදහස් වේ.

" අමාත්‍යවරයා" යන්නෙන් පළාතේ පරිවාස සහ ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ විෂයභාර අමාත්‍යවරයා අදහස් වේ.

"ස්ථාපන කමිටුව" යන්නෙන් මේ ප්‍රඥප්තියේ I වන උපලේඛනය යටතේ නිශ්චිතව සඳහන් පරිදි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා වූ අවම ප්‍රමිති යටතේ සංයුක්ත කරනු ලබන ස්ථාපනය කිරීමේ කමිටුව අදහස් වේ.

"පරිවාස නිලධාරියා " යන්නෙන් (24 වන අධිකාරිය වූ) වැරදිකරුවන් පරිවාස භාරයේ තැබීමේ ආඥා පනතේ 17 වන වගන්තිය යටතේ පරිවාස නිලධාරියකු ලෙස පත්කරනු ලැබූ නිලධාරියකු අදහස් වේ.

" ලියාපදිංචි කල ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය"යන්නෙන් මේ ප්‍රඥප්තියේ 8 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් අදහස් වේ.

" ඒකකය" යන්නෙන් (24 වන අධිකාරිය වූ) වැරදිකරුවන් පරිවාස භාරයේ තැබීමේ ආඥාපනත යටතේ අධිකරණ කොට්ඨාසයක් සඳහා පිහිටුවනු ලැබූ පරිවාස කාර්යාලයක් අදහස් වේ.

ශේෂ කිරීම.

38. (1) (142 වන අධිකාරය වූ) අනත්දරු නිවාස ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලදුව මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මකභාවයට පත්වන දිනයේදී ක්‍රියාත්මකව පැවති සහ පවත්වාගෙන යනු ලබන අනත්දරු නිවාසයකට, මේ ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද (2) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දින සිට මාස හයක කාලයක් ක්‍රියාත්මකව පවත්වාගෙන යනු ලැබීම සඳහා අවසර දිය යුතුය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් අනාථ නිවාසයක් ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා එකී උපවගන්තියේ සඳහන් කොට ඇති මාස හයක කාල පරිච්ඡේදය අවසන් වීමට පෙර මේ ප්‍රඥප්තියේ 7 වන වගන්තිය යටතේ ඉල්ලුම්කළ යුතු බවට නියම කරනු ලැබිය යුතුය.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීමක් සඳහා ඉල්ලුම්කරනු ලැබූ අවස්ථාවක කොමසාරිස්වරයා විසින් මේ ප්‍රඥප්තියේ V වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ තාවකාලික ලියාපදිංචි කිරීමේ සහතිකයක් ප්‍රදානය කළ යුතු අතර, එය මාස හයක කාලයක් සඳහා වලංගු විය යුතුය. තවද, එකී කාලය ඉකුත් වීමට පෙර උචිත වනු ලැබිය හැකි පරිදි

4 වන සහ 8 වන වගන්තිවල නිශ්චිතව සඳහන් නියමයන් හා අනුකූලව කටයුතු කිරීමට කොමසාරිස්වරයාට නියමිත වන අතර ඉන්පසු එකී අනාථ නිවාසය මේ ප්‍රඥප්තිය යටතේ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ලියාපදිංචි කල යුතුද, නොකළ යුතුද යන්න පිළිබඳ තීරණයක් ගත යුතුය.

39. මෙම ප්‍රඥප්තියේ, සිංහල, දෙමළ, ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලාත්මක වන්නේය.

## I වන උපලේඛනය

5 (1) වගන්තිය

**මධ්‍යම පළාතේ 2018 අංක 04 දරන ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය 5 (1) වගන්තිය යටතේ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා වූ තාවකාලික අනුමැතිය හා ලියාපදිංචිය සඳහා වන ඉල්ලුම් කිරීම.**

1. අනුමැතිය අපේක්ෂා කරනු ලබන ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නම ඃ
   (මධ්‍යස්ථානයට අදාල ව්‍යවස්ථාවේ පිටපතක් මඟින් තහවුරු කල යුතු වේ.)
2. ස්වේච්ඡා සංවිධානයක් ලෙස ලියාපදිංචි වීමේදී දෙනු ලබන ලියාපදිංචි අංකය ඃ
3. ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ඇතුළත් කිරීමට යෝජිත ළමුන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය සහ අවම සහ උපරිම වයස ඃ
4. යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය නඩත්තු කිරීම සඳහා පවත්නා අරමුදල්වල ප්‍රභවය ඃ
5. යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම පිණිස, වැය කිරීම සඳහා පවත්නා මුලු අරමුදල් ප්‍රමාණය ඃ
6. යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් සහ ලිපිනයන් ඃ
7. ඉල්ලුම්කරු, රෙගුලාසි මගින් අවම ප්‍රමිති සපුරා ඇත්තේද යන වග ඃ
8. යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීමට අපේක්ෂිත දේපලේ හිමිකම කා සතු ද යන්න ඃ
   (හිමිකම සනාථ කරන ඔප්පු ආදි නෛතික ලේඛන සමඟ තහවුරු කල යුතුය.)
9. යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය, පවත්වාගෙන යාම සඳහා ඉදිකිරීමට අපේක්ෂිත ගොඩනැගිල්ල හෝ ගොඩනැගිලිවල හෝ දැනටමත් පවත්නා ගොඩනැගිල්ල හෝ ගොඩනැගිලිවල අනුමත සැලැස්ම ;

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

..............................................................,
යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ
කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය .................................

## 11 වන උපලේඛනය

(6 (2) (ආ) වගන්තිය).

මධ්‍යම පළාතේ 2018 අංක 04 දරන ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය 6 (2) (ආ) යටතේ
තාවකාලික අනුමැති සහතිකය

............................................................ පළාතේ, පරිවාස හා ළමාරක්ෂක සේවා පළාත් කොමසාරිස් වූ ............................................................................. වන මා විසින්, ....................................................................... යනුවෙන් හඳුන්වනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථානයක්, ..........................................................................(ස්ථානය) පිහිටුවීම සඳහා 2018 අංක ........................... දරන ....................................................... පළාත් ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තියේ 6 (2) (ආ) වගන්තිය යටතේ මෙම තාවකාලික අනුමැති සහතිකය මෙයින් නිකුත් කරනු ලැබේ.

..................................................................,
පරිවාස හා ළමාරක්ෂන සේවා කොමසාරිස්වරයාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය .................................

## III වන උපලේඛනය

(8 (2) (අ) වගන්තිය)

මධ්‍යම පළාතේ 2018 අංක 04 දරන ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය 8 (2) (අ) වගන්තිය
යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකය

................................................................ පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා පළාත් කොමසාරිස් වූ ......................................................................... වන මම ................................................................................................................... (ස්ථානය) පිහිටුවා ඇති ............................................................................යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථානය අංක.................................................... දරන .................................................... පළාත් ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තියේ 8(2) (අ) වගන්තිය යටතේ, ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ලියාපදිංචි කරනු ලැබූ බව මෙයින් සහතික කරමි.

2018 ..................................මස .....................................දින නිකුත් කරන ලදී.

..................................................................,
පරිවාස හා ළමාරක්ෂක සේවා
කොමසාරිස්වරයාගේ අත්සන හා නිල මුද්‍රාව.

## IV වන උපලේඛනය

15(1) වගන්තිය.

මධ්‍යම පළාතේ 2018 අංක 04 දරන ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය 15 (1) වගන්තිය යටතේ වූ
වාර්තාව

ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නම සහ පිහිටීම :

* මෙදිනට එකී ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ විසුම් ඉඩ ලබා දී ඇති ළමුන්ගේ සංඛ්‍යාව සහ ස්ත්‍රී පුරුෂ භාවය ;

* මෙදිනට පෙරාතුවම වූ මාස තුන ඇතුළත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ළමුන් අතර සිටින බරපතල රෝග වලින් පෙළෙන ළමුන් සංඛ්‍යාව සහ එක් එක් රෝගයේ ස්වභාවය ;

* ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ සිටින ළමුන්ගේ සාමාන්‍ය කෑමවේලක ස්වභාවය සහ ප්‍රමාණය සහ එක් එක් ළමයාට ලබාදෙන වේල් ගණන ;

* මෙදිනට පෙරාතුවම වූ මාස තුන ඇතුළත ළමා සංවර්ධන මධ්‍යස්ථානය හැරදා ගිය ළමුන්ගේ (ඇත්නම්) සංඛ්‍යා සහ එසේ හැරදමා යාමේ හේතු ;

.................................................................,
ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ
කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය .................................

## V වන උපලේඛනය

38(3) වගන්තිය.

මධ්‍යම පළාතේ 2018 අංක 04 දරන ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය 38(3) යටතේ තාවකාලික ලියාපදිංචි කිරීමේ සහතිකය

....................................................... පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා පළාත් කොමසාරිස්වරයා වූ ........................................................................................ වන මා විසින්, (142 වන අධිකාරිය වූ) අනත්දරු ආඥාපනත යටතේ ස්ථාපිත කරනු ලැබුවා වූ ද ........................................................................ යන නමින් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන්නා වූ ද ..................................................................... පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථානයට, 2018 ...................................... මස ....................................... දින සිට මාස හයක කාලයක් සඳහා වලංගු විය යුතුය. මේ තාවකාලික ලියාපදිංචි කිරීමේ සහතිකය 2018 අංක ............................. දරන පළාත් ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තියේ 38(3) වගන්තිය යටතේ මෙයින් නිකුත් කරනු ලැබේ.

.................................................................,
පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :-

09 - 513

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.